ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| නිකුත් කළේ | **සංඛ්‍යාන දෙපාර්තමේන්තුව** |
|---|---|
| දිනය | **2012 / 05 /30** |

## ශ්‍රී ලංකා මහ බැංකුව
## ශ්‍රී ලංකාවේ ආර්ථික හා සමාජ සංඛ්‍යාන ප්‍රකාශනය - 2012

ශ්‍රී ලංකා මහ බැංකුව, එහි වාර්ෂික ප්‍රකාශනයක් වන ''ශ්‍රී ලංකාවේ ආර්ථික හා සමාජ සංඛ්‍යාන-2012'' ප්‍රකාශනයෙහි 34 වැනි වෙළුම දැන් නිකුත් කර ඇත. මෙම ප්‍රකාශනයෙහි දේශගුණය, ජනගහනය සහ ශ්‍රම බලකාය, ජාතික ගිණුම්, කෘෂිකර්මය, කර්මාන්ත, මිල සහ වැටුප්, ජාත්‍යන්තර වෙළඳාම සහ මූල්‍ය කටයුතු, ප්‍රාග්ධන සහ මූල්‍ය වෙළඳපොළ, රාජ්‍ය මූල්‍ය, බැංකු සහ මූල්‍ය ආයතන, ප්‍රවාහනය සහ සමාජ ආර්ථික සේවා යනාදී ශ්‍රී ලංකාවේ ආර්ථික හා සමාජ තත්ත්වය පිළිබිඹු වන පුළුල් පරාසයකින් යුත් දර්ශක මෙන්ම අනෙකුත් රටවල්වල තෝරාගත් ආර්ථික සහ සමාජ දර්ශක ද අන්තර්ගත වේ. එමෙන් ම, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින් පවත්වන ලද ආදායම් හා වියදම් පිළිබඳ සමීක්ෂණයන්ගෙන් සොයාගත් ශ්‍රී ලංකාවේ ජීවන තත්ත්වය, දරිද්‍රතාවය සහ කුටුම්බ ලක්ෂණවලට අදාළ තොරතුරු ද මෙහි ඇතුළත් කර ඇත. තවද, පළාත් මට්ටමින් සමාජ ආර්ථික තත්ත්වයන්, පවත්නා මිල අනුව දළ දේශීය නිෂ්පාදිතය, කෘෂිකර්මය, පශු සම්පත්, ජල පරිභෝජනය, විදේශ සේවා නියුක්තිය, වැවිලි කර්මාන්ත අංශයේ ශ්‍රම බලකාය සහ නිෂ්පාදනය වැනි මූලික ආර්ථික විචල්‍යයන්ගේ සවිස්තරාත්මක තොරතුරු ද මෙම ප්‍රකාශනයෙහි ඇතුළත් වේ.

දත්ත විශ්ලේෂණය කරන්නන්ගේ විවිධ අවශ්‍යතාවයන්ට ගැලපෙන අන්දමින් නොයෙක් ස්වරූපයෙන්/අනුබණ්ඩිත වශයෙන් සහ කාලශ්‍රේණී/හරස්කඩ වශයෙන් මෙම ප්‍රකාශනයෙහි දත්ත ඉදිරිපත් කර ඇත. ආර්ථිකයේ වත්මන් ප්‍රවණතාවයන් හැදෑරීමට උපකාරීවන තොරතුරු රාශියක් මෙහි අඩංගු වී ඇති අතර, මෙම ප්‍රකාශනය ව්‍යවසායකයන්ට, ප්‍රතිපත්ති සම්පාදකයන්ට, පර්යේෂකයන්ට, ගුරුවරුන්ට, ශිෂ්‍යයන්ට සහ මහජනතාවට ඉතා ප්‍රයෝජනවත් වනු ඇත.

පිටපතක මිල රු.300/=ක් වන මෙම ප්‍රකාශනය අංක 58, ශ්‍රී ජයවර්ධනපුර මාවතේ, බැංකු අධ්‍යයන කේන්ද්‍රයේ පිහිටි ශ්‍රී ලංකා මහ බැංකුවේ සන්නිවේදන දෙපාර්තමේන්තුවේ විකුණුම් කවුළුව, ශ්‍රී ලංකා මහ බැංකුවේ මාතර, මාතලේ, යාපනය, ත්‍රිකුණාමලය සහ අනුරාධපුර පිහිටි පළාත් කාර්යාල සහ දිවයිනේ ප්‍රධාන පොත්හල්වලින් මිල දී ගත හැකිය.